**සැ. යු. - (i)** 2021.06.11 වැනි දින පළ වූ අංක 2232 දරන *ගැසට් පත්‍රයේ* I.:III, II, III හා IV (ආ) කොටස් පළ නොවීය.

**(ii)** මෙවර පළවන *ගැසට් පත්‍රයේ* IV කොටසේ 2021 වර්ෂය සඳහා පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල සහ දෙමළ භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,233 - 2021 ජුනි මස 18 වැනි සිකුරාදා - 2021.06.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1032 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 1032 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1033 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ජූලි මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජුනි මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1031 – B 82240 — 402 (2021/06)
A 1-

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2021 අංක 537

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි ඩබ්ලිව්. පී. සේනාධීර මහතා 2020 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් තනතුරට පත්කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

ඩබ්ලිව්. එම්. ඩී. ජේ. ප්‍රනාන්දු,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2021 ජුනි මස 01 වැනි දින දී ය.

06 - 245/1

2021 අංක 538

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි ජී. කේ. ජී. ඒ. ආර්. පී. කේ. නන්දන මහතා 2021 මාර්තු මස 29 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති තනතුරට පත්කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

ඩබ්ලිව්. එම්. ඩී. ජේ. ප්‍රනාන්දු,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2021 ජුනි මස 01 වැනි දින දී ය.

06 - 245/2

2021 අංක 539

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ I ශ්‍රේණියේ නිලධාරි සපුතන්ත්‍රිගේ චන්ද්‍ර ජගත් මහතා 2021 අප්‍රේල් මස 19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, පූර්ණ කාලීන පදනම මත, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වැඩබැලීම සඳහා පත්කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

ඩබ්ලිව්. එම්. ඩී. ජේ. ප්‍රනාන්දු,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2021 ජුනි මස 01 වැනි දින දී ය.

06 - 245/3

2021 අංක 540

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි ශාන්ත වීරසිංහ මහතා 2021 මැයි මස 06 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති තනතුරට පත්කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

ඩබ්ලිව්. එම්. ඩී. ජේ. ප්‍රනාන්දු,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2021 ජුනි මස 01 වැනි දින දී ය.

06 - 245/4

# රජයේ නිවේදන

## රජයේ දැන්වීමයි

### 1952 තිස්සමහාරාම වන්දනා රෙගුලාසි

1952 තිස්සමහාරාම වන්දනා රෙගුලාසි ප්‍රකාරව තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම්, ඩී. එල්. කේ. ප්‍රියවංශ වන මම පහත සඳහන් කාලය තිස්සමහාරාම වන්දනා රෙගුලාසි බල පවත්වන කාලය වශයෙන් නියම කරමි.

2021 වර්ෂයේ පොසොන් උත්සවය 2021 ජුනි මස 19 වැනි දින සිට 2021 ජුනි මස 25 වැනි දින දක්වා වේ. (2021 ජුනි මස 19 සහ ජුනි මස 25 වැනි දින ද ඇතුළත් වේ).

ඩී. එල්. කේ. ප්‍රියවංශ,
ප්‍රාදේශීය ලේකම්,
තිස්සමහාරාම.

06 - 362

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහජන බැංකුව - හසලක ශාඛාව

### 1968 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ (29ඩී) වගන්තිය යටතේ වන යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021.03.26 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ණයකරුගේ නම - මහවල ගෙදර සරත් කරුණාදාස මයා

| | | *පහසුකම් අංක 01* | *පහසුකම් අංක 02* |
|---|---|---|---|
| ප්‍රදානිත මුදල | - | රු. 2,000,000 | රු. 5,000,000 |
| ප්‍රදානිත දිනය | - | 2018.10.31 | 2019.05.21 |
| අවම ලංසුව | - | රු. 15,500,000 | |

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ගලේවාසල රාජපක්ෂ මුදියන්සේලාගේ කුමුදුනී පාලමකුඹුර මහත්මිය විසින් සහතික කරන ලද 2018.10.22 දිනැති අංක 7135 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම අංක 528, මහයාය, උල්පොතගම, හසලක යන ස්ථානයෙහි පදිංචි මහවල ගෙදර සරත් කරුණාදාස යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 7135 දරන උකස්කරය යටතේ දැනට රු. 1,666,666.70ක (රුපියල් දහසය ලක්ෂ හැටහය දහස් හයසිය හැට හයයි ශත හැත්තෑවක) මුදලක් බැංකුවට අයවීමට ඇති බැවින් එම මුදල සහ රු. 2,056,507.85ක (රුපියල් විසි ලක්ෂ පනස් හය දහස් පන්සිය හතයි ශත අසූපහක) මුදල සඳහා 2019.06.30 වැනි දින සිට වර්ෂයකට 17.5% බැගින් පොළිය සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් දේවනාරායන ගෙදර ශ්‍යාමා ගීතාංජලී දයාරත්න මහත්මිය විසින් සහතික කරන ලද 2018.05.02 වැනි දිනැති අංක 5869 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම අංක 528, මහයාය, උල්පොතගම, හසලක යන ස්ථානයෙහි පදිංචි මහවල ගෙදර සරත් කරුණාදාස යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 5869 දරන උකස්කරය යටතේ දැනට රු. 6,068,376.44 (රුපියල් හැට ලක්ෂ හැට අට දහස් තුන්සිය හැත්තෑහයයි ශත හතළිස් හතරක) මුදල සහ රු. 7,831,098.18 (රුපියල් හැත්තෑ අට ලක්ෂ තිස්එක් දහස් අනූ අටයි ශත දහ අටක) මුදල සඳහා 2019.06.30 වැනි දින සිට වර්ෂයකට 17% බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය ද, මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල් අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකරු ඩැලස් කෙලාට් සමාගම විසින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ගලේවාසල රාජපක්ෂ මුදියන්සේලාගේ කුමුදුනී පාලමකුඹුර මහත්මිය විසින් සහතික කරන ලද 2018.10.22 දිනැති අංක 7135 දරන උකස්කරය සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් දේවනාරායන ගෙදර ශ්‍යාමා ගීතාංජලී දයාරත්න මහත්මිය විසින් සහතික කරන ලද 2018.05.02 වැනි දිනැති අංක 5869 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් යටතේ බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි, 1986 මහජන බැංකු පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙයින් තීරණය කරයි.

#### *උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මිනිපේ කන්ද පහළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ මිනිපේ ප්‍රාදේශීය සභා සීමාව තුළ, දඹේපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උල්පතගම ගමේ පිහිටා ඇති මාවීකන්ද නමැති ඉඩම සඳහා සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති අංක 320005 දරන පිඹුරේ කැබලි අංක 74 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් බින්දුවයි දශම පහයි හතරයි බින්දුවක් (හෙක්ටයාර් 0.540) විශාලත්වයට මායිම්, උතුරට : කට්ටි අංක 73 ද, නැගෙනහිරට : කට්ටි 29 ද, දකුණු නැගෙනහිරට : කට්ටි අංක 83 ද, බස්නාහිරට : කට්ටි අංක 75 ද යන මායිම් තුළ පිහිටි ඉඩම, ගොඩනැගිල්ල සහ ඊට අයත් සෑම සියලු දේද එකී පිඹුරේ පෙන්වා දී ඇති මාර්ගයන්හි පරවශ්‍යතා අයිතියද සමග වේ.

ඉහත ඉඩමට මෑතක දී අඳින ලද නව පිඹුරක් අනුව පහත පරිදි ද විස්තර වේ :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මිනිපෙ කන්ද පහළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ මිනිපේ ප්‍රාදේශීය සභා සීමාව තුළ, දඹේපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උල්පතගම ගමේ පිහිටා ඇති මාවීකන්ද නමැති ඉඩම සඳහා අවසරලත් මිනින්දෝරු ඩී. ඒ. වී. රත්නායක මහතා විසින් වර්ෂ 2015ක් මැයි මස 07 වැනි දින සාදන ලද අංක 2153 පිඹුරේ කැබලි අංක A දරන ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් එකයි, පර්. දහහතරක (අ. 01, රූඩ්. 01, පර්. 14.0) විශාලත්වයට මායිම්, උතුරට : සර්වේ ජනරාල්තැනගේ 32005 පිඹුරේ කැබලි අංක 73, නැගෙනහිරට : සර්වේ ජනරාල් තැනගේ අංක 32005 පිඹුරේ කැබලි අංක 83 දරන පිල්හත හසලක මාර්ගය ද, දකුණු බස්නාහිරට : සර්වේ ජනරාල්තැනගේ අංක 320005 පිඹුරේ කැබලි අංක 83 දරන නිවාසවල සිට පිල්හත දක්වා දිවෙන මාර්ගය ද, උතුරු බස්නාහිරට : සර්වේ ජනරාල්තැනගේ අංක 32005 පිඹුරේ කැබලි අංක 75 ද යන මායිම් තුළ පිහිටි ඉඩම, ගොඩනැගිල්ල සහ ඊට අයත් සෑම සියලු දේද එකී පිඹුරේ පෙන්වා දී ඇති මාර්ගයන්හි පරවශ්‍යතා අයිතියද සමග වේ.

මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්ඩීඕ/එන්/07/67/2015 දරන පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
17, දළදා වීදිය,
මහනුවර.

06 - 256

## මහජන බැංකුව - ලකී ප්ලාසා ශාඛාව

### 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021.04.29 වැනි දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් දීප්ති ආර්. මෙන්ඩිස් විසින් සහතික කරන ලද 2015.11.05 වැනි දින අංක 2549 දරන උකස් බැඳුම්කරය මතද, 2018.01.22 වැනි දින අංක 7324 දරන උකස් බැඳුම්කරය මත ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් දීප්ති ආර්. මෙන්ඩිස් විසින් සහතික කරන ලද 2018.04.11 වැනි දින අංක 7409 දරන උකස් බැඳුම්කරය මතද, අයවිය යුතු මුදල් ගෙවීම මෙහි භාවිතකර ඇති යෙදුම හෝ ප්‍රකාශය අනුව පද සම්බන්ධයෙන් විගෙන්සා ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සහ එහි අනුප්‍රාප්තිකයන් සහ පැවරුම් ලාභීන් අවශ්‍ය වන, පිළිගනු ලබන, අදහස් වන සහ ඇතුළත් වන "බන්ධනදායී" සමාගම යනුවෙන් හඳුන්වනු ලබන අංක 105/4, කුඩාමාදුව පාර, හොන්නන්තර, කැස්බෑව යන ලිපිනයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තාවූ ද, PV 64589 දරන අංකය යටතේ ලියාපදිංචි ඇති සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වූ විගෙන්සා ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් සහ (මෙහි මින්මතු "උකස් ගැණුම්කරු" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන) අංක 105/4, කුඩාමාදුව පාර. හොන්නන්තර, කැස්බෑව යන ලිපිනයේ පදිංචි විජයතිලක ගොඩකන්ද ආරච්චි යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී උකස් බැඳුම්කරය මත දැනට මහජන බැංකුව වෙත රුපියල් මිලියන දහනවයයි දෙලක්ෂ හැත්තෑ හත් දහස් තුන්සිය අනූ එකයි ශත තිස් නවයක් වූ (රු. 19,277,391.39) මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින හෙයින් ද,

අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම අඩු කිරීමෙන් පසුව විකුණුම් පිරිවැය සහ වෙනත් ගාස්තුද සමග අංක 2549 දරන උකස් බැඳුම්කරය මත 2021.03.20 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් රුපියල් හය ලක්ෂ හත් දහස් හයසියයක් වූ (රු. 607,600,00) මුදලක් මත වර්ෂයකට 14.0%ක අනුපාතිකයක් යටතේ වූ තවදුරටත් වූ පොළී මුදලක් ද සමග රුපියල් හත් ලක්ෂ දෙදහස් එකසිය විසිහයයි ශත හැට පහක්වූ (රු. 702,126.65) මුදලක් ද, 2021.03.20 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් රුපියල් දෙලක්ෂ හැට දහස් හාරසියයක් වූ (රු. 260,400.00) මුදලක් මත වර්ෂයකට 14.0% අනුපාතිකයක් යටතේ වූ තවදුරටත් වූ පොළී මුදලක් ද සමග රුපියල් තුන් ලක්ෂ හාර දහස් තුන්සියය හැට හතරයි ශත හතලිස් එකක් වූ (රු. 304.364.41) මුදලක් ද, අංක 7324 දරන උකස් බැඳුම්කරය මත 2021.03.20 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් රුපියල් නව ලක්ෂ තිස්හත් දහස් තුන්සියයක් වූ (රු. 937,300.00) මුදලක් මත වර්ෂයකට 19.0%ක අනුපාතිකයක් යටතේ වූ තවදුරටත් වූ පොළී මුදලක්ද සමග රුපියල් මිලියන එකයි අනූ පන් දහස් එකසිය අනූ අටයි හත දහතරක් වූ මුදලක්ද, 2021.03.20 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් රුපියල් මිලියන එකයි අටලක්ෂ අනූ දහසක් (රු. 1,890,000.00) මුදලක් මත වර්ෂයකට 19% අනුපාතිකයක් යටතේ වූ තව දුරටත් වූ පොළී මුදලක්ද සමග රුපියල් මිලියන දෙකයි දෙලක්ෂ අට දහස් දෙසිය හැත්තෑ තුනයි ශත හතළිස් පහක් වූ (රු. 2,208,273.45) මුදලක්ද, 2021.03.20 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් රුපියල් මිලියන එකයි අට ලක්ෂ අනූ දහසක් වූ (රු. 1,890,000.00) මුදලක් මත වර්ෂයකට 19.0%ක අනුපාතිකයක් යටතේ වූ තවදුරටත් වූ පොළී මුදලක්ද සමග රුපියල් මිලියන දෙකයි දෙලක්ෂ අට දහස් දෙසිය හැත්ත තුනයි ශත හතළිස් පහක්වූ (රු. 2,208,273.45) මුදලක් ද, අංක 7409 දරන උකස් බැඳුම්කරය මත 2021.03.20 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් රුපියල් මිලියන නවයයි නව ලක්ෂ අනූ දහසක්වූ (රු. 9,990,000.00) මුදලක් මත වර්ෂයකට 24.0%ක අනුපාතිකයක් යටතේ වූ තවදුරටත් වූ පොළී මුදලක්ද සමග රුපියල් මිලියන දොළහයි හත් ලක්ෂ පනස් නව දහස් එකසිය පනස් පහයි ශත විසි අටක් වූ (රු. 12,759.155.28) මුදලක්ද අයකර ගැනීම සඳහා ඉහත කී උකස් බැඳුම්කර මගින් ඉහත කී බැංකුව වෙත උකස් කරන ලද දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක මහත්මිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි, 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මතකර සිටිනු ලැබේ.

#### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව නගර සභා සීමාව ඇතුළත කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 585A හොන්නත්තර දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, හොන්නත්තර පිහිටා ඇත්තාවූ ද, "මූණමල්ගහ වත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද 1986.09.08 වැනි දින අංක 2615 දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස ලකුණුකර ඇත්තාවූ ද උතුරට : අම්බලම ලඟ කනත්ත ද, නැගෙනහිරට : ලොට් අංක 3 ද, දකුණට : ලොට් අංක A ද (අඩි 20ක් පළල පාර සඳහා වෙන්කළ ඉඩම් කොටස), බටහිරට : ලොට් අංක 1 ද යන මායිම් තුළ පිහිටා ඇත්තාවූ ද ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම පහක් වූ ද (අ. 0, රූ. 0, පර්. 11.5) දෙල්කඳ නුගේගොඩ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ C1002/32 දරන පත්තිරුවේ ලියාපදිංචි වී ඇති ඉහත කී ලොට් අංක 2 දරන බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ ගොඩනැගිලි, වගාවන් සහ වෙනත් සියලු දේද වේ.

පහත සඳහන් ඉඩම හරහා සහ ඒ ඔස්සේ යාම ඒමේ මාර්ග පරවශ්‍යතා අයිතිය සහ වෙනත් පොදු අයිතිවාසිකම්ද එයට ඇතුළත් වේ, එනම් -

ඉහත කී හොන්නත්තර පිහිටා ඇත්තාවූද "මූණමල්ගහ වත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා වූ එකී අංක 2615 දරන පිඹුරේ ලොට් A (මාර්ගය සඳහා වෙන්කළ කොටස) ලෙස ලකුණු කර නිරූපනය කර ඇත්තාවූ ද, උතුරට : ලොට් අංක 1, 2, 3, 13, 14, 15, 16, 17, සහ මූණමල්ගහවත්ත ද, නැගෙනහිරට : ලොට් අංක 4, 8, 6, 10, 11, 15 සහ මූණමල්ගහවත්ත ද, දකුණට : ලොට් අංක 8, 7C, 18, 24, D25, 26 සහ 27 ද, බටහිරට : ලොට් අංක 7, 9, 12, 14 සහ අඩි 20ක් පළල මාර්ගය ද යන මායිම් තුළ පිහිටා ඇත්තාවූද, ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහතුනයි දශම දෙකයි බිංදුවක් වූ ද (අ. 0, රූ. 1, පර්. 13.20) ඉහත කී ලොට් A දරන බෙදූ වෙන්කරන ලද ඉඩම් කොටස වේ.

ඉහත කී හොන්නන්තර පිහිටා ඇත්තාවූද "අම්බලම - කනත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද අංක 2616 දරන පිඹුරේ ලොට් A ලෙස ලකුණු කර නිරූපනය ඇත්තාවූද, උතුරට : කේ. තේමිස් යන අය විසින් හිමිකම් කියනු ලබන අම්බලම ලග කනත්ත යන ඉඩම ද, නැගෙනහිරට : මූණමල්ගහවත්ත ද, දකුණට : ලොට් අංක 45, 43 සහ 1 ද, බටහිරට : මාර්ගය ද යන මායිම් තුළ පිහිටා ඇත්තාවූ ද ප්‍රමාණයෙන් පර්චස් පහළොවක්වූ ද (අ. 0, රූ. 0, පර්. 15) ඉහත කී ලොට් A දරන බෙදූ වෙන්කරන ලද ඉඩම් කොටස වේ.

2. ඉහත කී හොන්නන්තර පිහිටා ඇත්තාවූද "මූණමල්ගහ වත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු එච්. ලාල් ගුණසේකර විසින් සාදන ලද 1992.03.15 වැනි දින අංක 4149 දරන පිඹුරේ "ලොට් අංක 2" ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තාවූ ද, උතුරට : මෙහි ලොට් අංක 1 ද, නැගෙනහිරට : ලොට් අංක 7 (අඩි 12ක් පළල මාර්ගයක් සඳහා වෙන්කල ඉඩම් කොටස) සහ මෙහි ලොට් අංක 3 ද, දකුණට : ජයකොඩි යන අය විසින් හිමිකම් කියනු ලබන දේපළ ද, බටහිරට : නෝමිස් අප්පුහාමි යන අය විසින් හිමිකම් කියනු ලබන මූණමල්ගහවත්ත යන ඉඩම ද යන මායිම් තුළ පිහිටා ඇත්තාවූද, එකී අංක 4149 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් දහයක් වූ (අ. 0, රූ. 0, පර්. 10) දෙල්කඳ-නුගේගොඩ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ C1002/35 දරන පත්තිරුවේ ලියාපදිංචි වී ඇති ලොට් අංක 2 දරන ඉහත කී බෙදූ වෙන්කරන ලද ඉඩම් කොටස වේ.

පහත සවිස්තරාත්මකව විස්තරකර ඇති මාර්ග පරවශතා අයිතිය ද ඊට ඇතුළත් වේ. එනම් -

ඉහත කී හොන්නන්තර පිහිටා ඇත්තාවූ ද, "මූණමල්ගහ වත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු එච්. ලාල් ගුණසේකර විසින් සාදන ලද 1992.03.15 වැනි දින අංක 4149 දරන පිඹුරේ ලොට් අංක 7 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තාවූ ද, (අඩි 12 පළල මාර්ගයක් සහ වටරවුමක් සඳහා වෙන්කළ කොටස) උතුරට : සිද්ධි අප්පු යන අය විසින් හිමිකම් කියනු ලබන මූණමල්ගහවත්ත ද, නැගෙනහිරට : මෙහි ලොට් අංක 3 සහ 4 ද, දකුණට : මෙහි ලොට් අංක 5, 4, 3 සහ 2 ද, බටහිරට : මෙහි ලොට් අංක 2 සහ 1 යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද. එකී අංක 4149 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් නවයක් වූ ද (අ. 0, රූ. 0, පර්. 9) ඉහතකී ලොට් අංක 7 දරන බෙදූ වෙන් කළ ඉඩම් කොටස වේ.

06- 350

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.